# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1998/30 – 2016 දෙසැම්බර් මස 22 වැනි බ්‍රහස්පතින්ද – 2016.12.22**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3(4) වගන්තිය යටතේ වූ නිවේදනය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය මලික් සමරවික්‍රම වන මා විසින් 2016 දෙසැම්බර් 06 වැනි දින අංක 1996/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* නියමයන්ට අතිරේකව මෙම නියමය මගින් පහත දැක්වෙන පරිදි ප්‍රකාශ කර සිටිමි. එනම් :-

2016 දෙසැම්බර් 06 වැනි දින අංක 1996/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියමයේ (03) වැනි වගන්තිය සඳහන් ව්‍යාපෘති සමාගමේ නාමය වෙනුවට පහත සඳහන් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

''චෙක් පෝට් සිටි කලම්බු (පුද්ගලික) සමාගම''

2016 දෙසැම්බර් 06 වැනි දින අංක 1996/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියමයේ පළමු උප ලේඛනයේ (1) (i) වගන්තියේ දෙවන ඡේදය පහත සඳහන් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

> ''එකී බදු නිදහස් කාල සීමාව ව්‍යාපෘති සමාගම විසින් බදු අය කළ හැකි ආදායම් උපයනු ලබන වර්ෂයේ සිට හෝ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද දින සිට වසර 06 කට පසු, යන අවස්ථාවන්ගෙන් ප්‍රථමයෙන් එළඹෙන වර්ෂයෙන් ආරම්භ විය යුතුය. මෙම අවස්ථා සඳහා 2015 මාර්තු 06 වැනි දින සිට ව්‍යාපෘති සමාගම, ශ්‍රී ලංකා ජනරජය සහ නාගරික සංවර්ධන අධිකාරිය ත්‍රෛපාර්ශවීය ගිවිසුම අත්සන් කළ දිනය වන 2016 අගෝස්තු 12 යන කාල පරිච්ඡේදය ඇතුළත් නොවිය යුතුය.''

2016 දෙසැම්බර් 06 වැනි දින අංක 1996/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියමයේ පළමු උපලේඛනයේ 02 වන වගන්තිය පහත සඳහන් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

> ''ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන ව්‍යාපෘතිය ආශ්‍රිත සියලු භාණ්ඩ ආනයන සහ එම ව්‍යාපෘති ආශ්‍රිත භාණ්ඩ සහ සේවාවල දේශීය මිලදී ගැනීම් සියල්ල, එම ව්‍යාපෘති ක්‍රියාත්මක වීමේ අවුරුදු අටක (08) කාලය තුළ දී එකතු කළ අගය මත බදු (වැට් බදු) ගෙවීමෙන් නිදහස් විය යුතුය. ව්‍යාපෘතිය සඳහා එම කොන්ත්‍රාත්කරු වෙත සැපයීම් කරනු ලබන යම් කොන්ත්‍රාත්කරුවකු හෝ උප කොන්ත්‍රාත්කරුවකු වැට් බදු පනත මගින් අවසර දී ඇති පරිදි බදු

විලම්බනය සඳහා හිමිකම් ලබයි. ව්‍යාපෘති සමගම විසින් ව්‍යාපෘති ක්‍රියාත්මක වීමේ අවුරුදු අටක (08) කාලය අවසන් වූ දින සිට 2002 අංක 14 දරන වැට් බදු පනතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට වැට් බදු ගෙවීම සඳහා යටත් විය යුතුය.''

කෙසේ වුවද පවතින නීතිය අනුව ව්‍යාපෘති සමාගම වෙතට බදු අයිතිවාසිකම් ලබාදීමද, ව්‍යාපෘති සමාගමට ලබා දී ඇති බදු අයිතිවාසිකම් අනාගත ගැනුම්කරුවන්ට පැවරීම හා බද්දට දීම එකතු කළ අගය මත බදු ගෙවීමෙන් නිදහස් විය යුතුය.''

2016 දෙසැම්බර් 06 වැනි දින අංක 1996/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියමයේ පළමු උපලේඛනයේ 07 වන වගන්තිය පහත සඳහන් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

''ව්‍යාපෘති සමාගම, කොන්ත්‍රාත්කරු සහ උපකොන්ත්‍රාත්කරුවන් අවුරුදු අටක (08) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව තුළ ජාතිය ගොඩනැගීමේ බදු ගෙවීමෙන් නිදහස් වන්නේය. තවදුරටත් පවතින නීතිය අනුව ව්‍යාපෘති සමාගම වෙතට බදු අයිතිවාසිකම් ලබා දීම ද, ව්‍යාපෘති සමාගම වෙත ලබා දී ඇති බදු අයිතිවාසිකම් යෝජිත ගැනුම්කරුවන් වෙත පැවරීම හා බද්දට දීම ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් වේ.''

මලික් සමරවික්‍රම පා.ම.,
සංවර්ධන ක්‍රමෝපාය සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය.

2016 දෙසැම්බර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

01-146

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.